ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන්ගේ දැනගැනීම සඳහා

## <u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු වලට පත්කිරීම - 2026</u>

2023.10.11 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023හි 6.1 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දැනටමත් ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් හට මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇති පුරප්පාඩුව පවතින I ශ්‍රේණියේ තනතුරු සඳහා ස්ථානමාරු ලබාගැනීමේ හැකියාව පවතී.

02. ඒ අනුව I ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා දැනටමත් I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් විසින් ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා වන ඉල්ලීම් පහත ලේඛන ද සමඟ 2026.03.20 දිනට පෙර ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 ලිපිනයට යොමුකරන ලෙස කාරුණිකව දන්වමි. එම දිනට පසුව ලැබෙන ඉල්ලීම් පිළිබඳව කටයුතු කරනු නොලැබේ.

I. නිලධාරියාගේ ඉල්ලීම් ලිපිය
II. ස්ථානමාරු වීමට අපේක්ෂා කරන තනතුරට අදාළ ආයතන ප්‍රධානියාගේ එකඟතාවය (රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක හා ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක තනතුරු සඳහා ආයතන ප්‍රධානියාගේ එකඟතාවය ලබා ගැනීම අවශ්‍ය නොවේ)
III. නිලධාරියා නිදහස් කිරීම සම්බන්ධව වර්තමාන ආයතන ප්‍රධානියාගේ නිර්දේශය
IV. විධිමත්ව සම්පූර්ණ කරන ලද EST 12 ආකෘති පත්‍රය
V. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ තනතුර අනුමත කිරීමේ ලිපිය
VI. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත
VII. දැනට දරන තනතුර සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධිමත් පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපත

03. **දැනටමත් ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් පමණක්** මේ සඳහා අයදුම්කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

දිනය : 2026.03.06

එච්.ජේ.ඩී.සී. ජයසේකර
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට

For the information of officers who hold the posts in Grade I of the Sri Lanka Accountants' Service

## Appointment to the posts in Grade I of the Sri Lanka Accountants' Service - 2026

As per the provisions in Section 6.1 of the Public Service Commission Circular No. 04/2023 dated 11.10.2023, officers currently holding the posts in Grade I of the SLAcS are eligible to obtain transfer for the vacant Grade I post published on the website of this ministry.

02. Accordingly, the officers who are already holding posts in Grade I, seek transfers to the posts in Grade I which have fallen vacant are kindly informed to send their request along with the following documents to Secretary, Ministry of Public Administration, Provincial Councils and Local Government, Independence Square, Colombo 07 on or before 20.03.2026. Action will not be taken with regard to the applications received after the said date.

I. Letter of request of the officer
II. Consent of the Head of Institution relevant to the post to which the transfer is sought [As per the decision of the Public Service Commission, it is not necessary to obtain the consent of the Head of the Institution for the post of Chief Internal Auditor and Internal Auditor (SLAcS Grade I )]
III. Recommendation of the current Head of Institution with regard to the releasing of the officer.
IV. Properly perfected Form EST 12
V. Letter of approval for the relevant post issued by the Department of Management Services
VI. A certified copy of the National Identity
VII. A certified copy of the formal letter of appointment issued by the Public Service Commission for the post held at present

03. It is further informed that strictly **the officers who hold posts in Grade I of SLAcS at present**, should apply for this.

Date : 06.03.2026

Sgd/ H.A.D.C. Jayasekara
Additional Secretary (Public Administration)
For Secretary
Ministry of Public Administration, Provincial Councils and Local Government